සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2018

### 6 - ශ්‍රේණිය

### පුරවැසි අධ්‍යාපනය

නම/විභාග අංකය :- ............................................................ කාලය: පැය 02යි.

## I කොටස

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- අංක 01 සිට 05 දක්වා ප්‍රශ්නවලට නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) පාසල් සමාජයේ සාමාජිකයෙකු වශයෙන් ඔබ සතු යුතුකමක් වන්නේ,

(1) අධ්‍යාපනය ලැබීම

(2) තම අදහස් ප්‍රකාශ කිරීම

(3) තම අනන්‍යතාව රැක ගැනීම

(4) සෙසු ළමයින් සමඟ සමානාත්මතාවයෙන් කටයුතු කිරීම

(02) ශ්‍රී ලංකාවේ උතුරු පළාතට අයත් දිස්ත්‍රික්ක සංඛ්‍යාව

(1) 02යි. (2) 03යි. (3) 04යි. (4) 05යි.

(03) ජීවානාශීත සම්පත් අතරට ගත නොහැකි සම්පත මින් කවරක් ද?

(1) ගොඩනැගිලි (2) ගංගා

(3) කලපු (4) වනාන්තර

(04) භෞතික සම්පතක් වන වනාන්තරවලින් අප ලබාගන්නා ප්‍රයෝජනයක් වන්නේ,

(1) සංචාරක (2) මහා මාර්ග

(3) කෘෂිකර්මය (4) ප්‍රවාහනය

(05) භූමිය සමාජ අවශ්‍යතාවයකට යොදාගත හැකි අවස්ථාවක් වන්නේ,

(1) වෙළෙඳ කටයුතු (2) ගෙවතු වගාව

(3) සංවර්ධන ව්‍යාපාර (4) නිවාස සංකීර්ණ ඉදිකිරීම

(ලකුණු 2×5=10)

- අංක 06 සිට 10 දක්වා ප්‍රශ්නවලට වරහන් තුළ දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා හිස් ඉරිමත ලියන්න.

(06) 1931 දී කන්නන්ගර මැතිතුමා ............................................ සභාවට තේරී පත් විය.

(07) සැලසුම්කරණය හා සංවිධානය නිසා ............................................ පිරිමැසේ.

(08) මිනිස්සු සාමූහික ජීවිතයක් ගත කිරීම නිසාම ...................................................... ගොඩනැඟිනි.

(09) අතීතයේ සිට පැවත එන සමාජ සම්මතයන් ...................................................... ලෙස හැඳින්වේ.

(10) අපේ අවශ්‍යතා ඉටුකර ගැනීමට යොදා ගන්නා සම්පත් අතර ...................................................... ක්ෂය වන සම්පතකි.

(සම්ප්‍රදායයන් / මිනිස් සමාජය / රාජ්‍ය මන්ත්‍රණ / කාලය / ඛනිජ තෙල්)

(ලකුණු 2×5=10)

- අංක 11 සිට 15 දක්වා ප්‍රශ්නවල දී ඇති ප්‍රකාශ නිවැරදි නම් ''නි'' යන්න වටා ද වැරදි නම් ''වැ'' යන්න වටා ද රවුමක් අඳින්න.

(11) ශ්‍රී ලංකාව පරිපාලන දිස්ත්‍රික්ක විස්සකින් සමන්විත වේ. (නි / වැ)

(12) භෞතික සම්පත් ප්‍රධාන කොටස් දෙකකින් යුක්ත ය. (නි / වැ)

(13) ග්‍රාම නිලධාරී කොට්ඨාසයක් එක ගමකින් හෝ ගම් කීපයකින් යුක්තවේ. (නි / වැ)

(14) සැලලුම් පතගත ශිෂ්‍යයා පාසලෙවෙන් අභියෝග ජය ගතිපි. (නි / වැ)

(15) ජය ගඟ වාරි තාක්ෂණයේ විස්මිත නිර්මාණයකි. (නි / වැ)

(ලකුණු 2×5=10)

- අංක 16 සිට 20 දක්වා ප්‍රශ්නවලට පිළිතුර තිත් ඉරි මත ලියන්න.

(16) අනුරාධපුරයේ තලාවැව සමීපයේ පිහිටි ...................................................... ගිරි පිළිමය ලෝකයේ ඇති විශිෂ්ට කලා නිර්මාණයකි.

(17) පියලු පුරවැසියන්ට පොදුවේ ප්‍රයෝජනයට ගත හැකි සේවා හා ඒවාට අයත් භාණ්ඩ ...................................................... වේ.

(18) නොකළ යුතු බවට සම්මතයේ ඇති කොන්දේසි සමූහය ...................................................... නම් වේ.

(19) අවධානයෙන් හා අවබෝධයෙන් යුතුව අසා සිටීම ...................................................... සවන්දීමයි.

(20) මහ නගර සභාවක ප්‍රධානියා වන්නේ ...................................................... ය.

(ලකුණු 2 x 5 = 10)

## <u>II කොටස</u>

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ. තවත් ප්‍රශ්න හතරකට පිළිතුරු සපයන්න.

(01) (1) උතුරු පළාතට අයත් දිස්ත්‍රික්ක දෙකක් ලියන්න.

(2) ස්වභාවික නොවන සම්පත් දෙකක් නම් කරන්න.

(3) ශබ්ද දූෂණයට බලපාන හේතු දෙකක් ලියන්න.

(4) ඔබේ පාසලේ අනන්‍යතාව පිළිබිඹු කරන සංකේත දෙකක් නම් කරන්න.

(5) විනය හා ශික්ෂණය සඳහා පුහුණු කල යුතු ගුණාංග දෙකක් නම් කරන්න.

(6) ඔබ ප්‍රදේශයේ ජනතාව ආර්ථික අවශ්‍යතා ඉටු කර ගැනීමට පිහිටුවා ගෙන ඇති සමිති දෙකක් ලියන්න.

(7) අප රටේ ඇති මහනගර සභා බල ප්‍රදේශ දෙකක් නම් කරන්න.

(8) සාමූහිකව කටයුතු කිරීමෙන් අපට ලැබෙන ප්‍රයෝජන දෙකක් ලියන්න.

(ලකුණු 2 x 8 = 16)

(02) (1) පාසල් සංස්කෘතියට අයත් දේවල් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(2) ළමයි සම්බන්ධයෙන් පාසලක පවතින පොදු නීති දෙකක් ලියන්න. (ලකුණු 04)

(3) ඔබේ පාසලේ තිබෙන සම්ප්‍රදායන් දෙකක් නම් කර එම සම්ප්‍රදායන් රැක ගැනීමේ වැදගත්කම ගැන කරුණු දෙකක් ලියන්න. (ලකුණු 05)

(03) (1) ඔබ ජීවත්වන පළාතට අයත් දිස්ත්‍රික්ක දෙකක් සඳහන් කරන්න. (ලකුණු 02)

(2) ඔබ පළාතට ආවේණික ස්වාභාවික සම්පත් හතරක් නම් කරන්න. (ලකුණු 04)

(3) භූමිය ආර්ථික කටයුතු සඳහා භාවිතා කරන ආකාරය නිදසුන් දෙකක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(04) (1) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මගින් ඔබට ලැබෙන සේවා දෙකක් ලියන්න. (ලකුණු 02)

(2) ඔබ ජීවත්වන ප්‍රදේශයේ තිබෙන පළාත් පාලන ආයතනය නම් කර ඉන් සිදුවන සේවා දෙකක් ලියන්න.

(ලකුණු 04)

(3) පහත දැක්වෙන්නේ ඔබට සහය වන රජයේ සේවකයින් පස් දෙනෙකුගේ සේවාවන් වේ.
එම සේවාවන් සිදුකරන නිලධාරියා නම් කරන්න.

1. රජය පනවන නීති රැකීම
2. ඡන්ද දැන්වීම් පත්‍රිකා බෙදා දීම
3. ගම් වැසියන්ගේ පදිංචිය තහවුරු කිරීම
4. බෝවන රෝග පාලනය
5. මාතෘ හා ළමා සෞඛ්‍යය රැක ගැනීමට උපදෙස් දීම (ලකුණු 05)

(05) (1) ඔබ යහපත් පුද්ගලයෙකු ලෙස කටයුතු කිරීමට පුහුණු කළ යුතු ගුණාංග දෙකක් ලියන්න. (ලකුණු 02)

(2) ආචාරශීලී කරනයේ දකිය හැකි අංග ලක්ෂණ දෙකක් ලියන්න. (ලකුණු 04)

(3) අන්‍යමත ගරු කරමින් සාකච්ඡා කර එකඟතාවයකට එළඹීම පුද්ගල හා සමාජ සංවර්ධනයට හේතු වන ආකාරය නිදසුන් දෙකක් මගින් පැහැදිලි කරන්න. (ලකුණු 05)

(06) (1) අපේ දිවි පැවැත්ම සඳහා අත්‍යවශ්‍ය සම්පත් දෙකක් ලියන්න. (ලකුණු 02)

(2) සම්පත් ප්‍රයෝජනයට ගන්නා ප්‍රමාණය දිනෙන් දින ඉහළ යාමට බලපා ඇති හේතු දෙකක් ලියන්න. (ලකුණු 04)

(3) පාසල් ශිෂ්‍යයෙකු ලෙස ඔබට ජලය හා විදුලිය අපතේ යාම වැළැක්වීමට දායක විය හැකි ආකාර දෙක බැගින් ද, ලී බඩු අපතේ යාම වළක්වා ගැනීමට දායක විය හැකි ආකාරයක් ද සඳහන් කරන්න. (ලකුණු 05)

(07) (1) පරිසරයේ මිනිසා විසින් ගොඩනගන ලද විවිධ දේවල් 'නිර්මිත පරිසරයට' අයත් වේ. මේ සඳහා නිදසුන් දෙකක් ලියන්න. (ලකුණු 02)

(2) යහපත් පුරවැසියෙකු ලෙස පරිසරය සුරැකීම සඳහා දායක විය හැකි ආකාර හතරක් ලියන්න. (ලකුණු 04)

(3) දේශීය නිෂ්පාදන හා දේශීය සම්පත් අගය කිරීමේ වැදගත්කම දක්වීමට කරුණු හතරක් ඉදිරිපත් කරන්න. (ලකුණු 05)

I කොටසට 2 × 20 = 40

II කොටස

(01) ප්‍රශ්නය 2 × 8 = 16

ප්‍රශ්න 4 × 11 = 44

= 100